# දැන්වීමයි

## ලැප්ටොප් පරිගණක යන්ත්‍ර මිලදී ගැනීම පිණිස ලබාදෙන පොලී රහිත ණය පහසුකම් ලබා ගැනීම

2016 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ විශ්වවිද්‍යාල සිසුන්ට ලැප්ටොප් පරිගණක මිලදී ගැනිම සඳහා යෝජිත ණය පහසුකම් රුහුණ විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම, හපුගල,මාපලාන සහ කරාපිටිය පරිශ්‍රයන් ආසන්නව පිහිටි මහජන බැංකු හා ලංකා බැංකු ශාඛා මඟින් ලබාගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

ඒ අනුව අදාළ ණය මුදල ලබා ගැනීමට අපේක්ෂා කරන සිසුන් තෝරාගත් බැංකු ශාඛාව වෙත පහත සඳහන් ලිපිලේඛන ඉදිරිපත් කල යුතුය.

I. ණය මුදල ලබා ගැනිම පිණිස අදාළ විශ්වවිද්‍යාලය මඟින් නිකුත් කරන ලද නිර්දේශිත ලිපිය. (මෙම ලිපිය අදාළ පීඨ කාර්යාල මඟින් හෝ ශිෂ්‍ය කටයුතු අංශය මඟින් නිකුත් කරනු ඇත.)

II. විශ්වවිද්‍යාලය මඟින් නිකුත් කරන ලද ශිෂ්‍ය හැඳුනුම්පත/ශිෂ්‍ය වාර්තා පොත සමඟ එහි ඡායාරූපය අඩංගු කොටසේ ඡායා පිටපතක්

III. ලැප්ටොප් පරිගණක යන්ත්‍රය අලෙවි කරනු ලබන ආයතනය/ වෙළඳහිමියා/ සැපයුම්කරුගෙන් ලබා ගත් ඉන්වොයිසිය.(ලැප්ටෝප් පරිගණක මිලදී ගැනීමේදී තෝරා ගත හැකි පරිගණක හා සැපයුම්කරුවන් පිළිබඳ විස්තර අදාළ පීඨ මඟින් දැනටමත් ඔබ වෙත දන්වා ඇත.)

IV. ශිෂ්‍යයාට/ශිෂ්‍යාවට මහපොළ/ශිෂ්‍යාධාර බැරවන මහජන බැංකු ගිණුම් පොත හෝ ගිණුමක් නොමැති නම් නව ගිණුමක් විවෘත කිරීමට පියවර ගත යුතුය. **(මහජන බැංකු ශාඛාවක් මඟින් ණය මුදල ලබා ගැනිමට අපේක්ෂා කරන සිසුන් සඳහා පමණි.)**

V. ඇපකරුගේ ශිෂ්‍ය හැඳුනුම්පත/ශිෂ්‍ය වාර්තා පොතෙහි ඡායා පිටපත

VI. ණයකරුගේ හා ඇපකරුගේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත් සහ ඡායා පිටපත්

මීට අමතරව ණය පහසුකම් ලබා ගැනීමේදී පහත සඳහන් කරුණු කෙරෙහිද අවධානය යොමු කල යුතු බව මහජන බැංකුව හා ලංකා බැංකුව විසින් දන්වා ඇත.

1. ණය මුදල සඳහා සුරැකුම් ලෙස රජයේ විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය හදාරන ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවකගේ පුද්ගල ඇප ලබාගැනිමට කටයුතු කරන අතර, එක් ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යාවකට ඇපකරුවකු ලෙස ඉදිරිපත් විය හැක්කේ එක් වරක් පමණි

2. අයදුම්කරුවන්/ඇපකරුවන් කිසිදු බැංකුවක/මූල්‍ය ආයතනයක ණය ගෙවීම පැහැර හැරී අයෙකු නොවිය යුතුය.
3. ශාඛාවෙන් නිකුත් කරන ණය අයදුම්පත හා ඇපකරු ප්‍රකාශය නිවැරැදිව සම්පූර්ණ කර ඉහත සඳහන් ලියවිලි ද සමඟ ශාඛාව වෙත භාරදිය යුතුය (අසම්පූර්ණ හා අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම ණය මුදළ ප්‍රමාද වීමට හේතු විය හැක.)
4. බැංකුවෙන් ලබාදෙනු ලබන උපරිම ණය මුදල රු. 75,000/- ක් වන අතර, ඊට වැඩි වටිනාකමකින් යුත් ලැප්ටොප් පරිගණක යන්ත්‍ර මිලදී ගැනීමේදී වැඩිපුර අවශ්‍ය මුදල ණය අයදුම්කරු විසින් දැරිය යුතුය. (ලැප්ටොප් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා එම යන්ත්‍රය අලෙවි කරනු ලබන ආයතනය/වෙළඳ හිමියා/සැපයුම්කරු වෙත ගෙවීම් ඇණවුමක් මඟින් සෘජුවම ගෙවීම් කිරීමට මහජන බැංකු විසින් පියවර ගනු ලබන බව දන්වා ඇත.)
5. ණය මුදලේ ආපසු ගෙවීමේ කාලය වසර 03 ක් වන අතර , ණය මුදල නිදහස් කළ දින සිට මාසික ණය වාරිකය, සෑම මසකම නියමිත දිනයේදී ගෙවීමට අයදුම්කරු කටයුතු කළ යුතුය.

ඒ අනුව මෙම ණය පහසුකම ලබා ගැනිමට අපේක්ෂා කරන සිසුන් ඉහත දක්වා ඇති ලියකියවිලි සමඟ රුහුණ විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම, හපුගල, මාපලාන සහ කරාපිටිය පරිශ්‍රයන් ආසන්නව පිහිටි පිහිටි මහජන බැංකු හෝ ලංකා බැංකු ශාඛාවක් වෙත ඉදිරිපත් කර ලැප්ටොප් පරිගණක මිලදී ගැනිමට හැකියාව ඇති බව මින් දන්වා සිටිමි.

ආචාර්ය ඒ.එම්.එන්. අලගියවන්න
නියෝජ්‍ය උපකුලපති
රුහුණ විශ්වවිද්‍යාලය

ආචාර්ය ඒ.එම්.එන්. අලගියවන්න
නියෝජ්‍ය උපකුලපති
රුහුණ විශ්වවිද්‍යාලය

පිටපත:-උපකුලපති

පීඨාධිපති (මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා/ කළමනාකරණ හා මූල්‍ය / වෛද්‍ය/ විද්‍යා/ ඉංජිනේරු/ ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ කෘෂිකර්ම) පීඨය – දැන ගැනීම සඳහා

ලේඛකාධිකාරි

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/ සහකාර ලේඛකාධිකාරි (මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා/ කළමනාකරණ හා මූල්‍ය / වෛද්‍ය/විද්‍යා/ඉංජිනේරු/ධීවර සහ සාගර විද්‍යා හා කෘෂිකර්ම )පීඨය සහකාර ලේඛකාධිකාරි/ශිෂ්‍ය කටයුතු – සිසුන් දැනුවත් කිරීමට සහ අමුණා ඇති ආකෘති පත්‍රය අනුව සකස් කළ නිර්දේශිත ලිපිය අදාළ බැංකු ශාඛා වෙත නිකුත් කිරීම සඳහා